සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 9 | විෂයය / பாடம் / Subject : කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

- මෙම කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු පත්‍රය ප්‍රශ්න පත්‍රයට අමුණා භාරදීම අනිවාර්ය බව සලකන්න.
- 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන යටින් ඉරක් අඳින්න.

(01) ප්‍රථම ශ්‍රාවකයින් තමන්ට අයිති සියල්ල ලබා දෙන්නේ ජේසුස් වහන්සේ බව අත්දැකීමෙන් අවබෝධ කරගත් පසු කළේ

(1) තම පව්කාර බව පිළිගැනීමයි.
(2) සියල්ල අතහැර ජේසුස් වහන්සේ අනුව යාමයි.
(3) දේව වචනයට කීකරු වී තම රැකියාව කිරීමයි.
(4) තමන් ලද සියල්ල අන් අය සමඟ බෙදා ගැනීමයි.

(02) දෙවියන් වහන්සේ ............................... වන ඔවුන් වහන්සේගේ ............................... විදහා පාන මහත් ක්‍රියා ප්‍රාතිහාර්යයන් වේ. මෙම ප්‍රකාශයේ හිස්තැන් දෙකට අදාළ වචන පිළිවෙලින් සඳහන් පිළිතුර වන්නේ,

(1) අනාවරණය , බලය
(2) බලය, අනාවරණය
(3) ප්‍රකාශ, නුවණ
(4) අනාවරණය , රශ්මිය

(03) හෙබ්‍රෙව් ලිපියට අනුව බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකයත්, අදෘශ්‍යමාන දේ පිළිබඳ පැහැදීමත් වන්නේ,


(1) විශ්වාසයයි. (2) ඇදහිල්ලයි.
(3) ප්‍රේමයයි. (4) බලාපොරොත්තුවයි.

(04) A - ස්තේපන්, පිලිප්, ප්‍රොකොරොස්
B - ස්තේපන්, තීමොන්, ඇන්ඩෘ
C - පිලිප්, නිකනෝර්, සීමොන්
D - පිලිප්, තීමොන්, පර්මෙනස්

ඉහත සඳහන් නම් කාණ්ඩ අතරින් උපස්ථායකයින්ගේ නම් පමණක් සඳහන් වන්නේ,

(1) A හා B වල ය. (2) B හා C වල ය.
(3) A හා D වල ය. (4) D හා C වල ය.

(05)




ඉහත රූප සටහනේ හිස්තැනට අදාළ වචනය වන්නේ,

(1) මුල් කිතුනු සභාවේ ලක්ෂණ
(2) ශ්‍රී ලංකා ශුද්ධ වූ සභාවේ ලක්ෂණ
(3) කිතුනු සමාජයේ ලක්ෂණ
(4) ශුද්ධ වූ සභාවේ ලක්ෂණ


(06) අප අතර දුකට වේදනාවට පත්ව අසරණව දුක් විඳින සොයුරු සොයුරියන් සොයා යමින් ඔවුන්ට අස්වැසිල්ලක් වීම

(1) යහපත් පුරුද්දකි. (2) අපගේ බලාපොරොත්තුවයි.
(3) අපගේ කිතුනු වගකීමයි. (4) සතුටට හේතුවකි.

(07) වත්මන් පූර්ව රාත්‍රී මෙහෙයේ නව ගිවිසුමෙන් තෝරා ගනු ලබන කියවීම් ගණන වන්නේ,

(1) 2කි. (2) 9කි. (3) 7කි. (4) 1කි.

(08)




මෙම රූප සටහන් අඳුරු කර ඇති කොටසට අනුව ශුද්ධ වූ සභාව දෙවියන් වහන්සේට සම්බන්ධ වන්නේ,

(1) මුල් කිතුනු සභාව මගිනි.
(2) අපොස්තුලුවරු මගිනි.
(3) පුත්‍රයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ මගිනි.
(4) ඊශ්‍රායෙල් ජනතාව මගිනි.

(09) ඉගැන්වීමට ද, වැරදි දුරු කිරීමට ද, හික්මවීමට ද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වන ග්‍රන්ථය වන්නේ,

(1) නව ගිවිසුමයි. (2) ශුද්ධ ලියවිල්ලයි.
(3) මහෝපදේශයයි. (4) පුරාණ ගිවිසුමයි.

(10) 'කතා කළ මැනව, ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටී' මෙලෙස දේව හඬට පිළිතුරු දුන්නේ,

(1) යෙසායා ය. (2) මරියතුමිය ය.
(3) ස්නාවක ජුවාම්තුමාය. (4) සාමුවෙල් ය.

(11) මෙලොව ජීවිතයේ දී දෙවියන් වහන්සේට අවනත වී තම ජීවිතය අන් අය වෙනුවෙන් කැප කරමින් ජීවත්ව, දැනුදු දෙවියන් වහන්සේ සමඟ ජීවත් වන අය

(1) පූජකවරු ය. (2) සාන්තුවරු ය.
(3) රදගුරුතුමන්ලා ය. (4) අසල්වැසියන් ය.

(12) 'සමාජ සාධාරණත්වයේ දූතයා' ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) දොමිනික් සාවියෝ මුනිතුමා
(2) ශාන්ත ඇලෝසියස් ගොන්සාගාතුමා
(3) මාටින් ද පෝරස් මුනිතුමා
(4) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා

Department of Education - Western Province

(13) A - ඉවසිලිවන්තවීම, ඊර්ෂ්‍යා නොවීම. කරුණාවන්ත වීම

B - කරුණාවන්ත වීම, උඩඟු නොවීම, අවිනීත නොවීම

C - අකීකරු නොවීම, අවංක නොවීම. ඉවසිලිවන්ත වීම

D - ආත්මාර්ථ නොවීම, හනික නොකිපීම, උඩඟු නොවීම

ඉහත ගුණාංග අතරින් 1 කොරෙන්ති ලිපියට අනුව ප්‍රේමයේ ගුණාංග පමණක් සඳහන් පිළිතුර වන්නේ,

(1) A, B හා C (2) A, C හා D

(3) B, C හා D (4) A, B හා D

(14) ඔබ ක්‍රිස්තුස් වහන්සේ තුළ කේන්ද්‍රගත වන විට ලැබෙන ඵලය වන්නේ,

(1) ශ්‍රේෂ්ඨ මිනිසෙකු වීම (2) හොඳ පුරවැසියෙක් වීම

(3) සමාජයේ කැපී පෙනීමට හැකිවීම (4) ධනවත් පුද්ගලයෙකු වීම

(15) 'මෙන්න ලෝකයේ පාපය දුරලන දෙවියන් වහන්සේගේ <u>බැටළු පෝතකයාණෝ</u>' මෙම ප්‍රකාශයේ ඉරි ඇඳි පදයෙන් අදහස් වන්නේ,

(1) ශුද්ධාත්මයාණෝ ය. (2) දෙවියන් වහන්සේ ය.

(3) ජේසුස් වහන්සේ ය. (4) ස්නාවක ජුවාම් තුමා ය.

(16) 'මා ඔබට කළාක් මෙන් ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි' යනුවෙන් පවසමින් ජේසුස් වහන්සේ සිදු කළ ක්‍රියාව වන්නේ,

(1) පව් සමාව ලබාදීමයි. (2) ගෝලයන්ගේ පාද සේදීමයි.

(3) අන්තිම රාත්‍රී භෝජනය වැළඳීමයි. (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමයි.

(17) විශ්වාසකයින්ගේ යැදුම් අයත් වන දිව්‍ය පූජාවේ පිළිවෙත වන්නේ,

(1) දේව වාක්‍ය පිළිවෙත (2) දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙත

(3) ආරම්භක පිළිවෙත (4) අවසාන පිළිවෙත

Department of Education – Western Province

(18) ජන වන්දනාවේ වැදගත්ම අංගය වන්නේ,

(1) ජපමාලයයි. (2) ශුද්ධ වූ පැයයි.

(3) දිව්‍ය පූජාවයි. (4) ගීතිකා ගායනයයි.

(19) කුරුසිය පාමුල දී 'සැබවින් ම මේ මනුෂ්‍යයා නිදොස් කෙනෙක්' යැයි ප්‍රකාශ කළේ,

(1) ශතාධිපතියා ය. (2) දකුණු පස සොරා ය.

(3) ජුවාම් ගෝලයා ය. (4) පිලාත් ය.

(20) අප අන් අයගේ යහපත සඳහා අප සතු වස්තුව බෙදා ගත යුත්තේ,

(1) අන් අයගේ උදව් උපකාර අපට ලැබෙන නිසා

(2) එය අපගේ යුතුකම වන නිසා

(3) දෙවිඳුන්ගෙන් අපට ජීවිතය හා සියලු දේ ලැබී ඇති නිසා

(4) අපට සමාජයේ පැසසුමට ලක්විය හැකි නිසා

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පාසලේදී ඔබ කළ ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු සපයන්න.

ඉරු දින දිව්‍ය යාගය තුළින් අපි දෙවිඳුන්ට උතුම්ම වන්දනාව පුද කරමු' 9 ශ්‍රේණියේ දරුවන් ලෙස ඔබ විසින් සංවිධානය කළ දිව්‍ය පූජාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) තුන්වන දේව පනතට අනුව අප දිව්‍ය පූජාවට සහභාගි විය යුතු අනිවාර්ය ණය යුක්තියක් ලෙස සැලකෙන දින මොනවා ද? (ලකුණු 02)

(2) දේව වාක්‍ය පිළිවෙතේ කොටස් 2ක් නම් කරන්න. (ලකුණු 02)

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන අවස්ථාවේ ගායනා කළ හැකි ගීතිකා 2ක් නම් කරන්න. (ලකුණු 04)

(4) දිව්‍ය පූජාව සංවිධානයේ දී සූදානම් කළ යුතු දේවල් 4ක් ලියන්න. (ලකුණු 04)

(5) වත්මන් සිසු පරපුර වෙනුවෙන් කිව හැකි විශ්වාසකයින්ගේ යැදුමක් ලියන්න. (ලකුණු 04)

(02) (1) ක්‍රිස්තුස් වහන්සේ ප්‍රථම ශ්‍රාවකයන් කැඳවමින් ප්‍රකාශ කළ වචන මොනවා ද?

(2) ජේසුස් වහන්සේව හඳුනා ගත් පසු අපෝස්තුළුවරුන් තුළ වූ වෙනස්කම් 3ක් ලියන්න.

(3) කිතුනු කැදවීමට අනුව ජේසුස් වහන්සේ තුළ ජීවත්වීමට කළ හැකි ක්‍රියා 6ක් ලියන්න. (2 +3 + 6 = 11)

(03) (1) මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ 2ක් ලියන්න.

(2) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණ 3ක් ලියන්න.

(3) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ මුල් කිතුනු සභාවේ අය මෙන් විශ්වාසයේ කිතුනු දිවියක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් 6ක් ලියන්න. (2 +3 + 6 = 11)

(04) (1) ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ හා උප කර්තෘ නම් කරන්න.

(2) ශුද්ධ බයිබලයේ දේවානුභාවයේ ආකාර තුන නම් කරන්න.

(3) දේව වචනය අන් අය වෙත ගෙන යාමට ඔබට හැකියාව ලැබෙන ලෙස ඉල්ලා කෙටි යැදුමක් ලියන්න. (වචන 50ක පමණ) (2 +3 + 6 = 11)

(05) (1) දෙවියන් වහන්සේ පොරොන්දු ඉටුකළ අවස්ථා 2ක් නම් කරන්න.

(2) සත්‍යයට සාක්ෂි දැරීමේ දී මුහුණ දෙන අභියෝග 3ක් ලියන්න.

(3) සත්‍යයට සාක්ෂි දැරීම නිසා ලැබෙන යහපත් ප්‍රතිඵල 6ක් ලියන්න. (2 +3 + 6 = 11)

(06) (1) ජේසුස් වහන්සේගේ ජීවිතයේ කැපී පෙනෙන ලක්ෂණ 2ක් ලියන්න.

(2) පැරණි ගිවිසුමේ යාග පූජා උදාහරණ 3ක් ලියන්න.

(3) ජේසුස් වහන්සේව ඔබේ ජීවිතයේ නියමුවා කර ගනිමින් ශ්‍රේෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ගොඩ නගා ගත යුතු ගුණාංග 6ක් විස්තර කරන්න. (2 +3 + 6 = 11)

(07) පහත සඳහන් මාතෘකා අතරින් 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. (වාක්‍ය 6ක්වත් අවශ්‍ය වේ

(1) ශුද්ධ බයිබලය (2) ජේසුගේ කුඩා මල වූ තෙරේසා තුමිය

(3) යෙසායා දිවැසිවරයා (4) අති උතුම් තෝමස් කුරේ කාදිනල් හිමිපාණෝ

Department of Education – Western Province